# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2281/33 - 2022 මැයි මස 27 වැනි සිකුරාදා - 2022.05.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XVI) (B)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2022 මැයි මස 24 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

2008 ඔක්තෝබර් මස 16 වැනි දින අංක 1571/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2008 අංක 2 දරන කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි-තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 8 වන ඡේදයේ (1) වන උපඡේදය ඉවත් කොට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන් :-

"(1) අධ්‍යක්ෂවරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා සහ ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා වන්නේ ය. ඔහු නිල බලයෙන් ආයතනයේ මණ්ඩලයේ, ශාස්ත්‍රීය කමිටුවේ සහ සියලු අධ්‍යයන මණ්ඩලවල සාමාජිකයකු වන්නේ ය. අධ්‍යක්ෂවරයාට, ආයතනයේ මණ්ඩලයේ, ශාස්ත්‍රීය කමිටුවේ සහ සියලු අධ්‍යයන මණ්ඩලවල යම් රැස්වීමකදී ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය. ආයතනයේ වෙනත් යම් බලමණ්ඩලයක හෝ පුද්ගල මණ්ඩලයක යම් රැස්වීමකට පැමිණ සිටීමට සහ ඒ රැස්වීමේ කතා කිරීමට අධ්‍යක්ෂවරයාට හිමිකම් ඇති නමුත් ඔහු එම බලමණ්ඩලයේ හෝ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ නම් මිස, එකී යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහුට හිමිකමක් නොතිබිය යුතු ය.";


1A - PG 5847 — 66 (2022/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එහි 10 වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"10. මණ්ඩලය ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය විය යුතු අතර එය පහත සඳහන් තනතුරුහෙන් සමන්විත විය යුතු ය :-

(1) නිල බලයෙන් පත්වන සාමාජිකයන්, එනම් :-

(අ) සභාපති විය යුතු අධ්‍යක්ෂවරයා ;

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

(ඇ) උසස් අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු ;

(ඈ) කෘෂිකර්ම විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු ;

(ඉ) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඊ) විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා ;

(උ) විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ පීඨාධිපතිවරයා ;

(ඌ) ආයතනයේ අධ්‍යයන අංශවල අංශ ප්‍රධානීන් ;

(එ) උපකුලපතිවරයාගේ එකඟතාව මත විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ශාක විද්‍යා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානියා හෝ ඔහුගේ නාමිකයකු ; සහ

(2) වෙනත් සාමාජිකයන්, එනම් :-

(අ) කෘෂි-තාක්ෂණ සහ කෘෂි-ව්‍යාපාරික කර්මාන්ත නියෝජනය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු ;

(ආ) සභාව විසින් සිය සාමාජිකයන් අතරින් පත්කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු ;

(ඇ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු ;

(ඈ) ශාස්ත්‍රීය මණ්ඩලය විසින් ස්වකීය සාමාජිකයන් අතරින් පත්කරනු ලබන එක් සාමාජිකයකු ; සහ

(ඉ) උපකුලපතිවරයාගේ නිර්දේශය මත සභාව විසින් පත්කරනු ලබන කෘෂිකර්ම විශේෂඥයන් දෙදෙනකු." ;

(3) එහි 16 වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"16. පර්යේෂණ සහ උසස් උපාධි සම්බන්ධයෙන් වන අධ්‍යයන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය :-

(අ) සභාපති විය යුතු අධ්‍යක්ෂවරයා ;

(ආ) එක් එක් අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානියා ;

(ඇ) එක් එක් මධ්‍යස්ථානයේ සම්බන්ධීකරන නිලධාරීන් හෝ ඔවුන්ගේ නාමිකයන් ;

(ඈ) එක් එක් අධ්‍යයන අංශය විසින් නම් කරනු ලබන එක් නියෝජිතයකු සහ පර්යේෂණ සහ සංවර්ධන හෝ පශ්චාත් උපාධි ඉගැන්වීමේ නිරතව සිටින එක් එක් මධ්‍යස්ථානය විසින් නම් කරනු ලබන එක් නියෝජිතයකු ;

(ඉ) එක් එක් හඳුනාගත් වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සඳහා ශාස්ත්‍රීය මණ්ඩලය විසින් පත් කරනු ලබන සාමාජිකයන් ;

(ඊ) විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ශාක විද්‍යා අංශයේ අංශ ප්‍රධානියා හෝ උපකුලපතිවරයා විසින් නම් කරනු ලැබිය යුතු එම අංශයේ වෙනත් ගුරුභවතකු ; සහ

(උ) විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ කෘෂිකාර්මික තාක්ෂණ අංශයේ අංශ ප්‍රධානියා හෝ උපකුලපතිවරයා විසින් නම් කරනු ලැබිය යුතු එම අංශයේ වෙනත් ගුරුභවතකු.”.

EOG 05 - 0134

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.